# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2071/19 – 2018 මැයි මස 16 වැනි බදාදා – 2018.05.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**(417 වැනි අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත**

දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ 16 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග. (417 වැනි අධිකාරය)

**මංගල සමරවීර,**
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 මැයි මස 16 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2009 ජුනි 24 වැනි දින, අංක 1607/18 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2009 අංක 01 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග සහ 2016 ජුනි 03 වැනි දින, අංක 1969/57 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිත නියෝග තව දුරටත් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ:-

1. රෙගුලාසිය 9 අවලංගු කර ඒ සඳහා මතු සඳහන් නව රෙගුලාසි ආදේශ කිරීම

**''ප්‍රාථමික අලෙවිකරුවන් පරීක්ෂා කිරීම සහ විමර්ශනය''**

9. (1) ප්‍රාථමික අලෙවිකාර සමාගමක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම එම ප්‍රාථමික අලෙවිකාර සමාගමේ ගණුදෙනුකරුවන්ගේ හිමිකම්වලට හානි නොවන ආකාරයට සහ ප්‍රාථමික වෙළඳ ක්‍රමයට අගතිදායක නොවන


1A – G27665 – 57 (2018/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බවට සහතික වීමේ කාර්යය සඳහා සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම මෙම ආඥාපනතේ විධිවිධානවලට සහ ආඥාපනත යටතේ සාදන ලද නියෝගවලට, මෙහෙයුම් අත්පොතට, ආචාර ධර්ම පද්ධතියට, මාර්ගෝපදේශවලට සහ වෙනත් අදළ ලිඛිත නීතියකට අනුකූලව ක්‍රියාකරන බවට සහතික වීම සඳහා මහ බැංකුවේ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය කරන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා හෝ එම දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයකු සෑම ප්‍රාථමික අලෙවිකාර සමාගමක ගිණුම සහ පොත්පත් පරීක්ෂා කළ යුතු අතර ප්‍රාථමික අලෙවිකාර සමාගමේ යම් නිශ්චිත කාරණයක් හෝ ක්‍රියාකාරකමක් පිළිබඳව විමර්ශන පැවැත්විය හැකි ය ;

(2) විද්‍යුත් හා වෙනත් චුම්භක මාධ්‍ය හරහා පවත්වාගෙන යන වාර්තා ඇතුළුව, ප්‍රාථමික අලෙවිකාර සමාගමක් වශයෙන් තම ක්‍රියාකාරකම්වලට අදළව පවත්වාගෙන යනු ලබන සියලු පොත්පත්, ගිණුම්, ලේඛන, ලිපිගොනු සහ වෙනත් වාර්තා ප්‍රාථමික වෙළෙඳ සමාගමක් විසින් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය කරන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාට ලබා දිය යුතු අතර, (1) වැනි ඡේදයේ සඳහන් කාර්යය සඳහා අවශ්‍ය විය හැකි ඕනෑම තනතුරක් ද, ලබා දිය යුතු ය ;

(3) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය කරන දෙපාර්මේන්තුවේ අධ්‍යක්ෂකවරයා හෝ එම දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයකුට, අධ්‍යක්ෂකවරයා විසින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවකදී, එහි පොත්පත් සහ වාර්තා, මුදල්, වත්කම්, සම්පූර්ණ වගකීම් සහ සාමාන්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමට සම්පූර්ණ අවස්ථාව ලබාදීම ප්‍රාථමික අලෙවිකාර සමාගමේ සෑම අධ්‍යක්ෂකවරයකුගේම, නිලධාරියෙකු හෝ සේවකයෙකුගේම යුතුකමකි ;

(4) ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස පත්කරන ලද යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රාථමික අලෙවිකාර ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම මුදල් නීති පනතෙහි (Monetary Law Act) 29 වන වගන්තියෙන් (422 වැනි අධිකාරය) බලය පවරා ඇති පරිදි බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකවරයා විසින් සිදුකළ යුතුය.

2. රෙගුලාසිය 10 අවලංගු කර ඒ සඳහා මතු සඳහන් නව රෙගුලාසිය ආදේශ කිරීම ;

**"අඛණ්ඩ අධීක්ෂණය සහ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කාර්යය සාධනය ඇගයීම"**

10. (1) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය කරන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා විසින්

(අ) (i) සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික වෙන්දේසිවලට ක්‍රියාකාරි ලෙස සහභාගි වීම ;

(ii) සුරැකුම්පත් පිළිබඳ ද්විතීයික වෙළෙඳපොළක් ඇති කිරීම සහ පවත්වාගෙන යාම ; සහ

(iii) අදළ නීති රීති, නියෝග, විධාන, මාර්ගෝපදේශ සහ ආචාර ධර්ම පද්ධතිවලට අනුකූල වීම පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම ;

සම්බන්ධයෙන්, ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල කාර්ය සාධනය නියත කාලීනව ඇගයීමට ලක්කළ යුතු ය.

(ආ) එවැනි ඇගයීමක් තුළ දී දැන ගැනීමට ලැබුණු අඩුලුහුඬුතා පිළිබඳව ප්‍රාථමික අලෙවිකාර සමාගමට දැනුම් දිය යුතු අතර, අදළ සමාගම් එම අඩුලුහුඬුතා නැති කර ගැනීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය කරන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා විසින් නිර්දේශ කරනු ලබන පියවර ගත යුතුය.

(ඇ) ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල අඛණ්ඩ අධීක්ෂණය සහ කාර්යය සාධනය ඇගයීම සඳහා ;

(i) ප්‍රාථමික අලෙවිකාර සමාගමේ කටයුතුවල සත්‍ය තත්වය නිර්ණය කිරීමේ අරමුණ සඳහා ඔහු විසින් ලබා ගැනීමට අවශ්‍ය යැයි සලකනු ලබන ප්‍රාථමික අලෙවිකාර සමාගමේ ව්‍යාපාර කටයුතුවලට අදළ තොරතුරු සහ වාර්තා ඔහු විසින් නිශ්චිතව සඳහන් කළ කාලයකට වරක් හෝ වරින්වර සැපයීම නියම කළ යුතුය ;

(ii) ඉහත පරිච්ඡේද (i) හි සඳහන් අරමුණට අදාළව ඔහු විසින් ලබා ගැනීමට අවශ්‍ය යැයි සලකනු ලබන ප්‍රාථමික අලෙවිකාර සමාගමක විගණකවරයා විසින් සිදු කරන ලද විගණනයන්ට අදාළ ඕනෑම තොරතුරක් ඔහු විසින් නිශ්චිතව සඳහන් කළ කාල සීමාවක් තුළ දී සැපයීමට ප්‍රාථමික අලෙවිකාර සමාගමේ විගණකවරයාට නියම කළ යුතුය ; සහ

(iii) ප්‍රාථමික අලෙවිකාර සමාගමක් සපයන ලද වාර්තාවක හෝ තොරතුරක නිරවද්‍යතාවය තහවුරු කරගැනීමේ අරමුණ සඳහා අවශ්‍ය යැයි පෙනී යන ඕනෑම විටෙක දී ඔහු හෝ ඔහුගේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයකු විසින් ප්‍රාථමික අලෙවිකාර සමාගමේ පොත්පත් සහ ගිණුම් පරීක්ෂා කිරීම කළ යුතු ය.

2. ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස පත්කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රාථමික අලෙවිකාර ක්‍රියාකාරකම්වල අඛණ්ඩ අධීක්ෂණය සහ කාර්යය සාධනය ඇගයීම මුදල් නීති පනතෙහි (Monetary Law Act) 29 A වැනි වගන්තියෙන් (422 වැනි අධිකාරය) බලය පවරා ඇති පරිදි බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් සිදුකළ යුතුය.

06 - 152

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.